**හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව**

**2023.01.24**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු ලේකම් හම්බන්තොට දිසාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සහ රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2023.01.24 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වන ලදි.

කමිටුවේ ගරු සභාපතිතුමන් නොවැලැක්විය හැකි හේතුවක් මත පැමිණීමට නොහැකි බව උදෑසන දැනුම් දුන්නද ඒ පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමට කාලවේලා මදි වූ බැවින් රැස්වීම සංවිධානය කළ පරිදි පවත්වන ලෙසත් එහිදී සාකච්ඡා කරනු ලබන කරුණු හා ගන්නා තීරණ පිළිබඳව තමා දැනුවත් කරන ලෙසත් ගරු සභාපති හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චමල් රාජපක්ෂ මැතිතුමන් තමා වෙත දැනුම් දුන් බව දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රකාශ කරමින් පැමිණ සිටි සියලුම නිලධාරීන් පිළිගන්නා ලදි.

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් වාර්තා නොවූ බැවින් එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලද අතර අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | **දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය** | | | |
| 1.1 | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තොරතුරු ඉදිරිපත් කිරීම | පසුගිය රැස්වීමේදී මන්දපෝෂණය, ඩෙංගු, බෝ නොවන රෝග ආදී වශයෙන් සවිස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කළ බැවින් මෙම රැස්වීමේ දී සුවිශේෂී කරුණ නොමැති බවට දන්වන ලදි. | | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 1.2 | ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය සඳහා වූ බහු ආංශික ක්‍රියාකාරී සැලැස්මට අදාල ප්‍රගතිය ඉදිරිපත් කිරීම | ග්‍රාමීය කමිටු නිලධාරීන් විසින් සිදුකරන ලද සමීක්ෂණයකින් ලබාගත් තොරතුරු මත හඳුනාගත් පවුල් ඉලක්ක කර ගනිමින් වියළි ආහාර මලු ලබා දීම, පාසල් ළමුන්, ගැබිනි මව්වරුන් සහ දිළිඳු පවුල්වල රෝගීන් සඳහා අවශ්‍ය උපකරණ හා මුදල් ආධාර ලබා දීම, පෙරපාසල් දරුවන් සඳහා දිවා ආහාර ලබා දීම, ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ස්වයං රැකියා සඳහා යොමු කිරීම, ජලාශවල මත්ස්‍ය පැටවුන් තැන්පත්කිරීම ආහාර විජලනය හා ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ප්‍රජා වැඩසටහන් පැවැත්වීම, පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීම, පොල භූමි සංවර්ධනය කිරීම ආදී වශයෙන් බොහෝ වැඩසටහන් පැවැත්වූ බවට කරුණු ඉදිරිපත් විය. මෙම වැඩසටහන් සියල්ලක්ම පවතින ආර්ථික අර්බුධයට කෙටි කාලීන විසඳුම් ලෙස සිදු කරන ලද ඒවා බවත්, මෙම වසර තුළදී ද ග්‍රාමීය කමිටු සම්බන්ධ කරගනිමින් ඒකාබද්ධ වැඩපිළිවෙලක් ලෙස කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව දන්වන ලදි. | අමාත්‍යාංශ හා ආයතන හරහා සිදුකරන වැඩසටහන් ග්‍රාමීය කමිටු මුල් කරගනිමින් සිදුකරන ලෙසත්, ලැබෙන ප්‍රතිපාදන අනුව ග්‍රාමීය ආර්ථික සුරක්ෂිතතාවය ඇතිකිරීම ප්‍රධාන ඉලක්කය කරගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙසත්, ඒ පිළිබඳව ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා දැනුවත් කිරීම් සිදුකරන ලෙසත්, මැතිවරණ සමයක් ප්‍රකාශයට පත්කර ඇති බැවින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී දේශපාලන මැදිහත්වීමකින් තොරව සිදු කිරීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | සියලුම ආයතනික ප්‍රධානීන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **02** | **දිස්ත්‍රික්කයේ ආර්ථික, සමාජීය සංවර්ධනයට අදාලව ආයතන මඟින් යොමු කර ඇති යෝජනා** | | | |
| 2.1 | තරුණසේවා සභාව සතු ඉඩකඩම් හා ගොඩනැගිලි භාවිතය සම්බන්ධ තොරතුරු ඉදිරිපත්කිරීම- එරමිණියාය/ නයිගල | එරමිණියාය තරුණසේවා මධ්‍යස්ථානයේ මුලු ඉඩමෙන් අක්කර 80ක පමණ සෞන්දර්ය නිකේතනය පිහිටුවා ඇති බවත්, තවත් අක්කර 20ක පමණ කෘෂිකර්ම, පරිගණක, ඔටෝ මොබයිල් ආදී පුහුණු පාඨමාලා සිදුකරන බවත්, තවත් කොටසක් කෘෂිකාර්මික කටයුතු සඳහා වෙන් කර ඇති බවත් එම කොටසේ පොල්, කුඹුරු හා වෙනත් භෝග වගා කර ඇති අතර අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා වැවක් ද පවතින බව දන්වන ලදි.<br>තව ද, රු ලක්ෂ 99 ක පමණ වටිනාකමින් යුත් කෘෂි උපකරණ ලැබී ඇති බවත් ශාකයට අවශ්‍ය ජලය හා අනෙකුත් පෝෂක සේවකයකු නොමැතිව ක්‍රියාත්මක වන නල පද්ධතියක් මඟින් ලබා දීමට හැකි පරිදි සකස් කර ඇති බවත් දන්වන ලදි.<br>කොට්ඨාස තරුණසේවා නිලධාරී විසින් හඳුනාගන්නා දිස්ත්‍රික්කයේ තරුණයින් 50 දෙනෙකු ලියාපදිංචි කර ඔවුන්ගේ කර්මාන්තයක් සිදුකිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බවත්, කෘෂිකාර්මික කටයුතු සඳහා කැමැත්තක් දක්වන තරුණයින් සඳහා වගා කිරීමට පමණක් ඉඩම් ලබා දීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක වන බවත් දන්වන ලදි.<br>එමෙන් ම මෙම ස්ථානයේ යන්ත්‍රෝපකරණ විශාල ප්‍රමාණයක් පවතින බවත් වාහන අලුත්වැඩියා කිරීමේ පහසුකම් තිබුණත් දැනට ඒවා සිදු නොකරන බවත් මෙහි පරිපාලන කටයුතු ප්‍රධාන කාර්යාලය හරහා සිදුවන බවත් දන්වන ලදි.<br>නයිගල යොවුන් සේනාංකයේ නායකත්ව හා කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක බව බවත්, ආයතනික පුහුනුව සඳහා විවිධ ආයතන සඳහා එම පිරිස් යොමු කරන බවත් දන්වන ලදි. භූමියේ කොටසක කෘෂිකාර්මික කටයුතු සිදුකරන බවත් දන්වන ලදි. | විවිධ ක්ෂේත්‍රයන් සඳහා තරුණයින් යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, වාහන අලුත්වැඩියා කිරීමේ පාඨමාලා හදාරන තරුණයින්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය කර ගැනීම සඳහා අලුත්වැඩියා කිරීමට ඇති රජයේ වාහන යොදා ගැනීම තුලින් දෙපාර්ශවයටම වාසි සැලසෙන බැවින් ඒ සම්බන්ධව ප්‍රධාන කාර්යාලය දැනුවත් කිරීමට තීරණය විය.<br>තව ද රජයේ සම්පත් අපතේ නොයන පරිදි කටයුතු කරන ලෙසත් ක්‍රියාත්මක කරන වැඩසටහන් පිලිබඳව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු දැනුවත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි.<br><br>නයිගල යොවුන් සේනාංකය පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්තාවක් ලබා දෙන ලෙස දන්වන ලදි. | ප්‍රාදේශීය ලේකම් - වීරකැටිය, අම්බලන්තොට / සහකාර අධ්‍යක්ෂ - ජාතික තරුණ සේවා සභාව<br><br>ප්‍රාදේශීය ලේකම් - වීරකැටිය / සහකාර අධ්‍යක්ෂ - ජාතික තරුණ සේවා සභාව |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.2 | “75 දී තාරුණ්‍යයේ ආදර්ශය - හරිත ශ්‍රී ලංකාව” වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම | මෙම වැඩසටහන 2023.02.04 වන දිනට යෙදෙන 75 වැනි නිදහස් දින සැමරුම වෙනුවෙන් ශ්‍රී ලාංකීය තරුණ ප්‍රජාවේ දායකත්වය හා මැදිහත්වීම මත දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන වැඩසටහනක් බව දන්වන ලදි. ඒ අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12ම ආවරණය වන පරිදි එක් කොට්ඨාසයකින් එක නගරයක් තෝරාගෙන පෙබරවාරි මස 01වන දින සිට සතියත් පුරාවට ශ්‍රමදාන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බවත් මේ සඳහා තරුණසේවා නිලධාරීන්ගේ මූලිකත්වයෙන් යෞවන සමාජ තරුණ තරුණියන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන අතර එම කටයුත්ත සාර්ථක කරගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් කොට්ඨාසයේ රාජ්‍ය ආයතනවල සහ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහාය ලබාගැනීමට අපේක්ෂා කරන බව දන්වන ලද අතර ඊට සහාය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. | මේ සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලෙස දන්වන ලදි. | සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් / සහකාර අධ්‍යක්ෂ - ජාතික තරුණසේවා සභාව |
| 2.3 | හෙද විද්‍යාලය සඳහා නේවාසික පහසුකම් ලබා ගැනීම හා සංවර්ධන කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම | හෙද විද්‍යාලයේ නේවාසිකාගාරවල හා අනෙකුත් පහසුකම්වල මද තාවය හේතුවෙන් සිසුන් අපහසුතාවයන්ට පත්ව ඇති බවත්, ඒවා පිළිසකර කර ගැනීම සඳහා ප්‍රතිපාදන නොමැති බවත් දන්වන ලදි. වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන ඉතා අල්ප වන බැවින් අත්‍යාවශ්‍ය ඖෂධ ලබා ගැනීම පවා අභියෝගයට ලක්ව ඇති බැවින් සංවර්ධන කටයුතු සඳහා මුදල් කළමනාකරණය කර ගැනීමේ හැකියාවක් නොමැති බව පෙන්වා දෙන ලදි.<br>පැරණි රෝහලේ හෙද නිවාස හෙද විද්‍යාලයේ නොවාසිකාගාර සඳහා ලබා ගැනීමට හැකි බවත් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු බවත් දන්වන ලදි. | අවශ්‍ය සංවර්ධන වැඩ සඳහා රාජ්‍ය නොවන සංවිධානවල සහාය ලබා ගැනීම සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන ලෙසත්, පැරණි රෝහලේ හෙද නිවාස නොවාසිකාගාර සඳහා ලබා ගැනීමට අවශ්‍ය ඉල්ලීම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා සිදුකරන ලෙසත් උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)/ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / රෝහල් අධ්‍යක්ෂ - හම්බන්තොට මහ රෝහල |
| 2.4 | ඕකෙවෙල පැරණි ප්‍රාදේශීය ලේකම් ගොඩනැගිලි ආයුර්වේද රෝහලෙන් නැවත ලබා ගැනීම | ප්‍රජා සෞඛ්‍ය කාර්යාලය හා සායන දෙකක් මෙම ගොඩනැගිල්ලේ පැවැත්වෙන බවත්, වලස්මුල්ල ප්‍රදේශය සඳහා ආයුර්වේද රොහලක් නොමැති බැවින් මෙය රෝහලක් ලෙස ක්‍රියාත්මක වීමෙන් ප්‍රදේශයේ ජනතාවට මහඟු සේවයක් ඉටුකළ හැකි බවට අදහස් | ආයුර්වේද දෙපාර්තමේන්තුව සඳහා කොවිඩ් කටයුත් වෙනුවෙන් තාවකාලිකව පවරා ඇති මෙම ගොඩනැගිල්ල නැවත පවරා දීම ආයුර්වේද දෙපාර්තමේන්තුවේ | අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන)/ ප්‍රාදේශීය ලේකම් - ඕකෙවෙල, බෙලිඅත්ත / පළාත් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ඉදිරිපත් විය. කොවිඩ් වසංගත සමයේ කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක අවශ්‍යතාවය පැවති බැවින් ඒ සඳහා බෙලිඅත්ත ආයුර්වේද රෝහල යොදා ගනිමින් ප්‍රජා සෞඛ්‍ය කටයුතු පවත්වාගෙන යාම සඳහා මෙම ගොඩනැගිල්ල දිස්ත්‍රික් ලේකම් විසින් තාවකාලිකව ලබාදුන් බවත්, එම භූමියේ ඕකෙවෙල කොට්ඨාසයේ ග්‍රාමීය මට්ටමේ කාර්යාල, දකුණු පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන මැහුම් පුහුණු පාඨමාලාව, රැකියා ලක්ෂයේ වැඩසටහනට අදාල පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදිය දැනට සිදුවන බවත්, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කාර්යාලයේ බිම් සවිය වැඩසටහන, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විමර්ශන ඒකකය, සමෘද්ධි විගණන ඒකකය ආදී කාර්යාල සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත් පෙන්වා දෙන ලදි. තව ද මෙම ගොඩනැගිල්ල අබලන් තත්ත්වයේ පවතින බැවින් ආයුර්වේද රෝහලක් ලෙස පවත්වාගෙන යාම සඳහා සුදුසු මට්ටමට ප්‍රතිසංස්කරණය කිරීමට විශාල මුදලක් ද වැය කිරීමට සිදුවන බැවින් දැනට බෙලිඅත්ත ආයුර්වේද රෝහල මඟින් රෝගීන් සඳහා නේවාසිකාගාර ප්‍රතිකාර කිරීම සිදුකරන බැවින් එම රෝහල භාවිතා කිරීම වඩාත් ඵලදායී බව පෙන්වා දෙන ලදි. | වගකීම බව පෙන්වා දෙන ලදි. තව ද ආයුර්වේද රෝහලක අවශ්‍යතාවය බෙලිඅත්ත රෝහලෙන් ද සම්පූර්ණ කර ගත හැකි බැවින් කාර්යයන් රැසක් සඳහා යොදාගත හැකි මෙම ගොඩනැගිල්ල එක් කාර්යයක් වෙනුවෙන් වෙන්කිරීම අකාර්යක්ෂම ක්‍රියාවලියක් බවද පෙන්වා දෙන ලදි. මේ සම්බන්ධයෙන් අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන) ගේ ප්‍රධානත්වයෙන් ඕකෙවෙල, බෙලිඅත්ත ප්‍රාදේශීය ලෙක්ම්වරු හා පළාත් ආයුර්වේද කොමසාරිසගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් සතියක් ඇතුලත වාර්තාවක් ලබා ගැනීමට තීරණය කරන ලදි. | ආයුර්වේද කොමසාරිස් |
| 2.5 | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ දී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පිළිබඳව දැනුවත් කිරීම | වී මිල සම්බන්ධයෙන් වී අලෙවි මණ්ඩලයේ සහතික මිලක් තිබුණ ද ප්‍රායෝගිකව වී මිලදී ගැනීමේ දී ගැටලු පවතින බව දන්වන ලදි. මේ හේතුවෙන් අස්වනු සඳහා මිලක් නොමැතිවීම, එම නිසා නැවත යෙදවුම් කිරීමට නොහැකි වීම වැනි කරුණු මත දිස්ත්‍රික්කයේ වී ගොවිතැන අවධානමට ලක්ව ඇති බව පෙන්වා දෙන ලදි. වී මිලදී ගැනීම පෞද්ගලික අංශ වෙත පැවරීමෙන් ගොවීන් තවත් අපහසුතාවයට පත්වන බැවින් වී මිලදී ගැනීම වී අලෙවි මණ්ඩලය වෙතම ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදි. | මුදල් අමාත්‍යාංශයේ මීට අදාල සාකච්ඡාවක් ඉදිරියේ දී පැවැත්වෙන බැවින් එහිදී මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන බව දන්වන ලදි. | දිස්ත්‍රික් ලේකම් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.6 | වන අලින්ට ගමන්කිරීමට නොහැකි වන පරිදි අධිවේගී මාර්ගයේ ඇති කල්වට් සඳහා එල්ලෙන විදුලි වැට ඉදිකිරීම | කෘෂිකර්ම වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී කල්වට් තුලින් වන අලීන්ට ගමන් කළ නොහැකි පරිදි එල්ලෙන විදුලි වැට සවි කිරීමට ප්‍රදේශවාසීන් විසින් ඉල්ලා සිටින ලද බවත්, අවශ්‍ය පරිදි නැවත ඉවත් කිරීමට හැකි වන ලෙස එල්ලෙන විදුලි වැට සවිකිරීමට හා අදාල ප්‍රදේශවල මුර සංචාරක කටයුතුවල යෙදවීම තුලින් අලීන් ගම්වැදීම වළක්වාගත හැකි බවටත් කරුණු ඉදිරිපත් විය.<br>අදාල ද්‍රව්‍ය සඳහා මූල්‍ය පිරිවැය ව්‍යාපෘතිය මඟින් ලබාගෙන විදුලිවැට ඉදිකිරීමට හැකි බවද දන්වන ලදී. | අදාල ආයතන නැවත රැස්වී සාකච්ඡා කර සුදුසු තීරණ ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘති අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (වනජීවී දකුණ) |
| 2.7 | සුහුරු ව්‍යාපෘතිය යටතේ ක්‍රියත්මක කරන ලද ව්‍යාපෘති අදාල ආයතනවලට පවරා දීම | දේශගුණික සුහුරු ව්‍යාපෘතිය මඟින් 2021 හා 2022 වර්ෂවල පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජනසේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වාරි මාර්ග ව්‍යාපෘති 25ක පුනරුත්තාපන කටයුතු අවසන් කර ඇති බවත්, ඒවායේ නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවුනහොත් ඉතා කෙටි කාලයක් තුලදී නැවතත් පෙර තත්ත්වයට පත්විය හැකි බැවින් කිසියම් රාජ්‍ය ආයතනයකට පැවරීම සුදුසු බවත්, ගොවි සංවිධාන මඟින් නඩත්තු කටයුතු සිදු කළ ද මේ වන විට ඒ සඳහා ගොවි සංවිධාන සතුව මූල්‍යමය හැකියාවක් නොමැති බවත් දන්වන ලදී.<br>කඩවර රක්ෂිතය සඳහා ප්‍රවාහන අපහසුතා පවතින බවටද කරුණු ඉදිරිපත් විය. | ආයතනවලට පැවරීම සඳහා කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර දිසාවන නිලධාරී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) ආදී නිලධාරීන් සාකච්ඡා කර සුදුසු වැඩපිලිවෙලක් සකස් කරන ලෙස හා අදාල වැව් නිරීක්ෂණය කරන ලෙස උපදෙස් ලබා දුනි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / දිසාවන නිලධාරී / අදාල අනෙකුත් ආයතන |
| 2.8 | දේශගුණික අව බලපෑම් අවම කිරීමේ බහුඅධියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) ව්‍යාපෘතිය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම | දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි කඩිනමින් හා ක්ෂණිකව සිදුකළ යුතු මහා, මධ්‍ය හා කුඩා වාරි පද්ධතිවල ඇල මාර්ග, ජල බස්නාවන්, ගේට්ටු, ගංවතුර බැම්, සහ ඇලවල් වල ජල කළමනාකරණය කිරීමට අවශ්‍ය මෙවලම් හා කෘෂි මාර්ග අලුත්වැඩියා කිරීමට අදාල කාර්යයන් ගොවි සංවිධානවල සෘජු මැදිහත් වීම සහ ග්‍රාමීය හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම | ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ හා සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කර අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙසත් නව යෝජනා පවතීනම් ඒවාද ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි.<br>ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ | වාරි මාර්ග අධ්‍යක්ෂ |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වන බවත්, ඒ සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය කොට්ඨාසයේ ප්‍රමුඛතා අනුපිලිවෙලට තොරාගත් ව්‍යාපෘති 47ක් හා හම්බන්තොට කොට්ඨාසයේ ව්‍යාපෘති 191ක් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන ලදි. | අනුමැතිය ලබා දුනි. | |
| 2.9 | ලෝක බැංකු අධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ඉදිකරන ලද ධාන්‍ය ගබඩා පවරාගැනීම හා සංවර්ධනය කිරීම (වීරවිල, රිදියගම NLDB /මයුරපුර පොල භූමිය) | මයුරපුර පොල භූමියේ ඇති ගබඩා වල මෙට්‍රික් ටොන් 150 පමණ ධාන්‍ය ගබඩා කළ හැකි බවත්, එහි තාවකාලිකව පළතුරු ගබඩා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය බවත්, ඊට අමතරව දීර්ඝ කාලීන වශයෙන් පළතුරු අපනයනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් යටතේ Cold room හා green house ඉදිකිරීම ආදිය සිදු කළ යුතු බවත් දන්වන ලදි. මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ දැනුවත් කළ බවත් දන්වන ලදි. | නව සංවර්ධනයන් සිදුකිරීමට ප්‍රථමයෙන් පවතින ගොඩනැගිල්ල ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගතහැකි ආකාරය පිළිබඳව සොයා බලන ලෙස උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ - කෘෂිකර්ම |
| 2.10 | ඒකාබද්ධ ජලධාරා හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) පිළිබඳව දැනුවත් කිරීම | මෙම ව්‍යාපෘතිය ජල පෝෂක ප්‍රදේශ හා ජල සම්පත් සැලසුම්කරණය වැඩිදියුණු කිරීම මෙන් ම ජලය හා සම්බන්ධ යටිතල පහසුකම්වල ක්‍රියාකාරීත්වය ඉහල නැංවීම අරමුණු කොටගත් ලෝක බැංකු ආධාර මත වාරි මාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් බවත්, ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශ සඳහා කළමනාකරණ සැලසුම් සැකසීම, ජල පෝෂක ප්‍රදේශ ප්‍රතිස්ථාපනය හා බහු ආංශික ජලසම්පත් සැලසුම්කරණය, වාරි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා අවධානමට ලක්වූ වේලි හා ඇළමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකරන බවත් දන්වන ලදි.<br>දිස්ත්‍රික්කයට වෙන් කිරීමට ඇති ප්‍රතිපාදන ලෝක බැංකුව මඟින් අනුමත වූ පසු සැලසුම් සකස් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂකවරුන්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපෘති කළමනාකරුවන් හා පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් යටතේ සිදුවන බැවින් ඒ සඳහා දැනට පවතින යෝජනා සහ නව යෝජනා | මේ සම්බන්ධයෙන් අවධානය යොමු කොට අදාල යෝජනා ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | වාරිමාර්ග අධ්‍යක්ෂ / නේවාසික ව්‍යාපාර කලමනාකරු - මහවැලි අධිකාරිය / පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අදාල නිලධාරීන්ට යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි. | | |
| 2.11 | දිසාගම වැව් රක්ෂිතය තෘණ වගා කිරීම සඳහා අඟුණකොළපැලැස්ස පශු වෛද්‍ය කාර්යාලය වෙත පවරා ගැනීම | මෙම වැව් රක්ෂිතය අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සත්ත්ව පාලනයේ යෙදෙන කිරි ගොවීන් සඳහා ලිඛිතව නිදහස් කර ඇති නමුත් මේ වන විට අනවසර වගා කරුවන් විසින් වගා කටයුතු සිදුකිරීම නිසා කිරි ගොවීන් ගැටලුකාරී තත්වයකට මුහුණු පා ඇති බවට තොරතුරු ඉදිරිපත් විය. ඒ අනුව, තෘණ වගා කිරීම සඳහා අඟුණකොළපැලැස්ස පශු වෛද්‍ය කාර්යාලයට ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. | මේ සම්බන්ධයෙන් මෙම කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර අවශ්‍ය පරිදි ඉදිරි කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - අඟුණකොළපැලැස්ස /පශු වෛවද්‍ය නිලධාරී - අඟුණකොළපැලැස්ස |
| 2.12 | වල්සපුගල හා කුරුලු උයන හරහා ගමන් ගත් බස්රථය ධාවනය නොවීම නිසා අන්දරවැව ධර්මධූත විද්‍යාලයේ සිසුන් සඳහා ප්‍රවාහන පහසුකම් නොමැති වීම | අන්දරවැව, වල්සපුගල හා කුරුළු උයන මාර්ගය හරහා ගමන් කළ බස් රථය මෑතක සිට ධාවනය නොවීම හේතුවෙන් හ / අන්දරවැව ධර්මදූත මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන දරුවන්, ගුරු භවතුන් හා දෙමාපියන් අපහසුතාවට පත්ව ඇති බවත්, මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ළමා හා කාන්තා කමිටුවේ දී සාකච්ඡා කිරීමෙන් අනතුරුව අම්බලන්තොට ඩිපෝ කළමනාකරුට ලිඛිතව දැනුම් දී ඇති බවත් දන්වන ලදි. | බස් රථයේ අලුත්වැඩියා කටයුතු සිදු වූ බවත්, සතියක් ඇතුලත බස් රථය ධාවනයේ යෙදවීමට කටයුතු කරන බවට අම්බලන්තොට ඩිපෝ කළමනාකරු විසින් දැනුම් දුන් බව දන්වන ලදි. | ඩිපෝ කළමනාකරු - අම්බලන්තොට ඩිපෝව |
| **03** | **පසුව ලැබුණු ලිපි** | | | |
| 3.1 | අලුත් ගමක් - අලුත් රටක් ජාතික ඒකාබද්ධතා සහභාගීත්ව සංවර්ධන වැඩසටහන 2023 – 2025 පිළිබඳව දැනුවත් කිරීම | මේ වනවිටත් සියලුම දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වන ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන, සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන හා වෙනත් රේඛීය අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක වන සමගාමී වැඩසටහන් ද ඒකාබද්ධ කරමින් ග්‍රාම නිලධාරී වසම් තුළම ප්‍රතිපත්තිමය තීරණ ගන්නා පාර්ශවයන්ගේ සිට ප්‍රතිලාභ ලබන අවසන් පුද්ගලයා දක්වා සමස්ථයෙන් සැදුම්ලත් ඒකාබද්ධ යාන්ත්‍රණයක් සමඟ අඛන්ඩ පසු විපරමක් සහිතව ප්‍රායෝගික වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන ඉදිරියේ දී ක්‍රියාත්මක වන බවත් ඒ අනුව, සියලුම අමාත්‍යාංශ හා ආයතන විසින් සිදුකරන ව්‍යාපෘතිද ග්‍රාමීය ආර්ථික කේන්ද්‍රය හරහා සිදුකරන ලෙස දන්වා ඇති බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | | සියලුම ආයතන ප්‍රධානීන් |
| 3.2 | හම්බන්තොට මහ රෝහල පිහිටි ඉඩම රෝහල වෙත පවරා දීම | නව රෝහල ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම පවරා දුන්නද නාගරික සංවර්ධන අධිකාරියට අයත් කොටසක් ද ඇතුලත්වන පරිදි රෝහල ඉදිකිරීම නිසා ඉඩම නිරවුල් කර ගැනීම සම්බන්ධ | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | රෝහල් අධ්‍යක්ෂ - හම්බන්තොට මහ රෝහල / නේවාසික ව්‍යාපාර කළමනාකරු - |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | ගැටලුවක් පවතින බවට තොරතුරු ඉදිරිපත් විය. නාගරික සංවර්ධන අධිකාරියට අයත් කොටස ද රෝහලට පැවරීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත දන්වා යවා ඇති බවත්, අනුමැතිය ලද වහාම පවරාදීම සිදු කළ හැකි බවත් දන්වන ලදි. | | මහවැලි අධිකාරිය / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 3.3 | වලස්මුල්ල මූලික රෝහලේ අභ්‍යන්තර මාර්ග පද්ධතියේ ඉතිරි වැඩ නිම නොකිරීම හේතුවෙන් මතු වී ඇති ගැටලු | මෙම මාර්ග පද්ධතියේ සංවර්ධන කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකළ බවත් මේ වන විටත් ඉතිරි වැඩ නිම නොකිරීම හේතුවෙන් ගැටලු මතු වී ඇති බවත් දන්වන ලදි. | මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා කර සුදුසු තීරණ ගන්නා ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - වලස්මුල්ල / වෛද්‍ය අධිකාරී - වලස්මුල්ල මූලික රෝහල |
| 3.4 | තංගල්ල - වලස්මුල්ල - බෙලිඅත්ත දක්වා ගමන් ගත් බස් රථය ධාවනය නතර කිරීම හේතුවෙන් රෝහල් කාර්ය මණ්ඩලය මුහුණ පා ඇති ගැටලු | තංගල්ල ඩිපෝව මඟින් ධාවනය කරන ලද මෙම බස්රථය ධාවනය නතර කිරීම හේතුවෙන් තංගල්ල ප්‍රදේශයේ සිට පැමිණෙන සේවකයින් ප්‍රවාහන අපහසුතාවයන්ට මුහුණ පා ඇති බවත්, සවස 5න් පසුව ධාවනය වන බස් රථ බෙලිඅත්ත දක්වා පමණක් ධාවනය වන බවත් දන්වන ලදි. | එම බස් රථය ධාවනය කරවීමට කටයුතු කරන මෙන් උපදෙස් ලබා දුනි. | ඩිපෝ කළමනාකරු - තංගල්ල |

2023 වර්ෂයේ ප්‍රථම රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලයට හා කමිටුවේ සියලුම සාමාජිකයන් වෙත ස්තුතිය පලකරමින් ප.ව 11.30ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

එච්. පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

එච්.පී.සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

2023 පෙබරවාරි මස ......01...... දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.